# වෛද්‍ය නිලධාරීන් සඳහා වූ උතුරු නැගෙනහිර ස්ථානමාරු ක්‍රමය

උතුරු නැගෙනහිර ස්ථාන මාරු ක්‍රමය යුද්ධය පැවති සමයේ සිට ක්‍රියාත්මක කරන ලද්දකි. එනම් උතුර සහ නැගෙනහිර පළාතට පළමු පත්වීම් ලබාදෙන වෛද්‍ය නිලධාරීන් සඳහා දිරි ගැන්වීමක් ලෙස වසරක සක්‍රීය සේවා කාලයකින් පසු තමනට පහසු සේවා ස්ථානයක් ලබාදීමටත්, රුපියල් 10,000 ක් දීමනාවක් ඇතුළු පහසුකම් ලබා දෙන ලදී. පසුව මුල්‍යමය දීමනාව අහෝසි කරන ලද අතර උතුරු නැගෙනහිර වසරක සේවා කාලයකින් පසු පහසු සේවා ස්ථානයක් ලබා දීම සඳහා වූ ස්ථාන මාරු ක්‍රමය පමණක් ක්‍රියාත්මක කරන ලදී.

2009 වසරේ මැයි මස සිට යුද්ධය අවසන් වීම සමග මහාමාර්ග සහ පොදු ප්‍රවාහන සේවා දියුණු වීම හේතුවෙන් එම ස්ථාන මාරු ක්‍රමයෙන් බැහැර වී ඌන පහසුකම් සහිත සේවා ස්ථාන ක්‍රමය හඳුන්වා දීමට යෝජණා විය. තවද අංක 01-22/2001 දරන 2001 09.30 දිනැති ස්ථාන මාරු චක්‍ර ලේඛයේ අංක 8 පරිච්ඡේදයේ සඳහන් පරිදි දිගටම උතුරු නැගෙනහිර මාරු ක්‍රමය ලබා දීමට අමාත්‍යාංශය බැදී නොමැති බව ද එහි සඳහන් වේ.

මෙම උතුරු නැගෙනහිර ස්ථාන මාරු ක්‍රමය නිසා පුහුණු හා ප්‍රදේශයට අනුගත වන නිලධාරීන් එම ප්‍රදේශවලින් වසරෙන් වසර මාරු වී යාම නිසා රටේ අනෙකුත් ප්‍රදේශවල මෙන් එක දිගට කාර්යක්ෂම සේවයක් ලබා දීමට නොහැකි වීම බලවත් ගැටලුවක් විය. එම ප්‍රදේශවල දේශපාලන අධිකාරිය, සිවිල් සංවිධාන මෙන්ම විශේෂඥ වෛද්‍ය නිලධාරීන්ගේ ඉල්ලීම වූයේ උතුරු නැගෙනහිර ස්ථාන මාරු ක්‍රමය අහෝසි කරන ලෙසයි. එහෙත් විවිධ ප්‍රතිවිරෝධතා නිසා එය පමා විය.

2017.01.24 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ ලිපියේ දැක්වෙන සාකච්චා තීරණ 4 පරිදි සහ වර්තමාන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටු ලේකම්ගේ 2017.07.28 ලිපිය සහ 2017.07.06 ලිපි වලට අනුව උතුරු නැගෙනහිර මාරු ක්‍රමය බැහැර කර ඌන පහසුකම් සහිත සේවා ස්ථාන ක්‍රමය හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලෙස දන්වා ඇත.

ඒ අනුව 2016.07.22 දිනෙන් පසුව පත්වීම් ලබාදුන් කණ්ඩායමෙන් පසු, පත්වීම් ලබා දුන් කිසිදු කණ්ඩායමක් සඳහා නිකුත් කල පත්වීම් ලිපිවල උතුරු නැගෙනහිර ට පත්වීම් ලබන වෛද්‍යවරුන්ට වසරකට පසු උතුරු නැගෙනහිර ස්ථාන මාරු ලැයිස්තු ලබාදෙන බව සඳහන් කර නැත.

**මේ අනුව** අමාත්‍යාංශය සකස් කල ඌන පහසුකම් සහිත සේවා ස්ථාන ලයිස්තුව සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2018 වසරේ දී අනුමැතිය ලබා දී ඇත. අනතුරුව 2019 වසරේ අප්‍රේල් මස නැවත සියලුම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වෙත දන්වා 2019 වසරට අදාල ලැයිස්තුවද සකස් කර ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහාද රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමැතිය ලබා දී ඇත. කෙසේ වෙතත් අංක 01-22/2001 දරන 2001 09.30 දිනැති චක්‍ර ලේඛයේ අංක 8 පරිච්ඡේදයේ සඳහන් උතුරු නැගෙනහිර ස්ථාන මාරුවලට අදාල කොටස අවලංගු නොකිරීම පිලිබඳව වෘත්තීය සමිති අමාත්‍යාංශයේ අවධානයට යොමු කල අතර සෞඛ්‍ය ලේකම්ගේ උපදෙස් පරිදි එය අහෝසි කිරීමට තීරණය කරන ලදී.

රටේ සියළුම ප්‍රදේශ සඳහා සමානාත්මතාවයෙන් සෞඛ්‍ය සේවය සැපයීමත්, තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී සාර්ව සෞඛ්‍ය ආවරණය සඳහා වූ සෞඛ්‍ය සේවා සැපයීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුව දිවයිනේ සියළුම ප්‍රදේශ සඳහා මානව සම්පත සමානව ලබා දීමත් රජයේ වගකීමකි. එවැනි අවස්ථාවක උතුරු නැගෙනහිර යනුවෙන් වෙන් කර සැලකීම සුදුසු නොවන බැවින් වෛද්‍ය නිලධාරීන්ට පමණක් උතුරු නැගෙනහිර ස්ථාන මාරු ක්‍රමයක් පවත්වාගෙන යාම සුදුසු නොවේ.

අවසන් වරට 2016.07.22 පත්වීම් ලබාදුන් 2015.11.27 දින ප්‍රාථමික ශ්‍රේණියට පත්කළ කණ්ඩායමට උතුරු නැගෙනහිර ස්ථානමාරු ලැයිස්තුවක් ලබාදුන්නේ **<u>ඔවුන්ගේ පත්වීම් ලිපියේ එය සඳහන් කර තිබූ බැවිනි</u>**. <u>ඉන් පසුව පත්වීම් ලබා දුන් කණ්ඩායම්වලට පත්වීම් ලබාදෙන විටම නිකුත් කල ලිපියේ උතුරු නැගෙනහිර ස්ථාන මාරු ක්‍රමය ගැන සඳහන් කර නොමැති බැවින්ද, රාජ්‍ය සේවා කොමිෂම උතුරු නැගෙනහිර ස්ථාන මාරු ක්‍රමය බැහැර කරන ලෙස ලිඛිතව දන්වා</u> ඇති බැවින්ද මින් ඉදිරියට උතුරු නැගෙනහිර ස්ථාන මාරු ක්‍රමය ක්‍රියාත්මක නොවේ. ඒ වෙනුවට ඌන පහසුකම් සහිත සේවා ස්ථාන ක්‍රමය හඳුන්වා දී ඇත.

කෙසේ නමුත් 2019.07.18 දින සෞඛ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු නිලධාරීන් සහ වෛද්‍ය නිලධාරී සංගමයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවති සාකච්ඡාවේදී ප්‍රකාශ වූ පරිදි වසර දෙකකට වැඩි කාලයක් උතුරු නැගෙනහිර සේවය කර ඇති වෛද්‍ය නිලධාරීන් සඳහා විශේෂ ස්ථාන මාරු ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිපත් කර ඇත. එම අනුමැතිය ලද විගස එම ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කරමින් සිටින බව සතුටින් දන්වා සිටිමු.

සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

අධ්‍යක්ෂ (වෛද්‍ය සේවා)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය'' කොළඹ 10.